WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

11 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනය ලෙස ප්‍රකට සූත්‍රයේ නම කුමක් ද?

(ii) බුදුදහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම **දෙක** කවරේ ද?

(iii) "යො ධම්මං පස්සති සො පටිච්චසමුප්පාදං පස්සති" මෙම පාඨයේ අදහස ලියන්න.

(iv) සිවු බඹ විහරණ ලියා දක්වන්න.

(v) "නහි වෙරෙන වෙරානි - සම්මන්තීධ කුදාචනං
අවෙරෙන ච සම්මන්ති - එසධම්මො සනන්තනො" මෙම ගාථාවේ අදහස ලියන්න.

(vi) ත්‍රිලක්ෂණය නම් කරන්න.

(vii) ජාතක කථා පාදක කොට කෝට්ටේ යුගයේ දී ලියැවුණු කාව්‍ය ග්‍රන්ථ **දෙකක්** ලියා දක්වන්න.

(viii) බුදුදහමේ දැක්වෙන පරිදි සිත කිලිටි කරන අකුසල මූල **තුන** නම් කරන්න.

(ix) අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලකයින් දෙදෙනකු වූ වළගම්බා සහ මහසෙන් යන රජවරුන් විසින් ඉදි කළ ස්තූප **දෙකේ** නම් ලියන්න.

(x) සතර සතිපට්ඨාන ලියා දක්වන්න.

**2.** (i) සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති මොනවා ද?

(ii) මහා අභිනිෂ්ක්‍රමණයේ සිට බුද්ධත්වය දක්වා සිදුහත් සිරිතේ ප්‍රධාන සිදුවීම් ලියන්න.

(iii) "ළමා අවධියේ සිට ම පරාර්ථකාමී වීම ජීවිතයට අත්‍යවශ්‍ය ගුණයකි." බුදු සිරිත ඇසුරෙන් මෙය සාකච්ඡා කරන්න.

**3.** (i) "ඇසුරු කිරීමට තමන්ට වඩා උසස් අයකු හෝ සමාන අයකු හෝ නොමැති නම් හුදෙකලාව වාසය කිරීම සුදුසු ය." මේ බව අවධාරණය කෙරෙන ධම්මපද ගාථාව ලියන්න.

(ii) එම ගාථාවේ දැක්වෙන 'බාලයා' යනු කවුරුන් දැයි පැහැදිලි කරන්න.

(iii) ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්මපදයෙන් ඔබට ලැබෙන උපදෙස් ඇගයීමට ලක් කරන්න.

**4.** (i) ආර්ය සත්‍යය හතර නම් කරන්න.

(ii) "සම්මා වාචා" යන්න ධර්මානුකූල ව පැහැදිලි කරන්න.

(iii) මධ්‍යම ප්‍රතිපදාව ජීවිත කාලය තුළ දී ම සැනසීම ලබා දෙන මාර්ගයක් බව පෙන්වා දෙන්න.

**5.** (i) ශ්‍රී ලංකාවේ බෞද්ධ පාසල් ආරම්භ කිරීමට, සර් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් විසින් ගත් පියවර හඳුන්වන්න.

(ii) ඩේවිඩ් හේවාවිතාරණ තරුණයා අනගාරික ධර්මපාල බවට පත් වූ අයුරු දක්වන්න.

(iii) "මානසික වහල්භාවය නමැති අන්ධකාරයේ නිමග්නව සිටි සිංහල බෞද්ධයන්ට ආලෝකය සැපයූ ප්‍රදීපස්තම්භයක් ලෙස ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා හැඳින්විය හැකි ය." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

6. (i) තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු මොනවා ද?

(ii) තෙවැනි ධර්ම සංගායනාව සම්බන්ධ ව අසා ඇති පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

* සංගායනාව සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළ රහතන් වහන්සේ කවු ද?
* සංගායනාවට අනුග්‍රහය ලබා දුන් රාජ්‍ය පාලකයා කවු ද?
* සංගායනාව පැවැත් වූ ස්ථානය නම් කරන්න.

(iii) ථෙරවාද බුදුදහමේ දේශාන්තර ව්‍යාප්තිය සඳහා තෙවැනි ධර්ම සංගායනාව ඉවහල් වූ අයුරු විස්තර කරන්න.

7. (i) ඉරියවු අනුව බුද්ධ ප්‍රතිමා බෙදා දක්වන වර්ග **තුන** නම් කරන්න.

(ii) බුද්ධ ප්‍රතිමා නිර්මාණකරණයේ ආරම්භය හා විකාශය සිදු වූ අයුරු පහදන්න.

(iii) බුදුරජාණන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණ ප්‍රකට වන අයුරෙන් ශ්‍රී ලාංකික කලා ශිල්පීන් බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ යෙදී ඇති අයුරු නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....